# මන්ත්‍රීවරුන්ට ආචාර ධර්ම හඳුන්වාදීමේ පනතට සිදුවූ දෙයක් නෑ

## ශ්‍රී ලංකා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය

**ඉන්දික සේවාවිතාරණ**

පසුගිය වසරේ පෙබරවාරි 02 වැනිදා පාර්ලිමේන්තුවේ සම්මත කිරීමට සැලසුම් කළ මන්ත්‍රීවරුන්ට ආචාර ධර්ම හඳුන්වාදීමේ පනතට සිදු වූ දෙයක් නැතැයි ශ්‍රී ලංකා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය සඳහන් කරයි.

මේ නිසා වහාම මෙම ආචාරධර්ම පද්ධතිය පාර්ලිමේන්තුවේ සම්මත කර, රට තුළ ක්‍රියාත්මක කළ යුතු බවත්, මාස 15 ක් තිස්සේ මේ රටේ ජනතාව එම කටයුත්ත සිදුකරනු ඇතැයි බලාපොරොත්තුවෙන් සිටින බවත් එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ අසෝක ඔබේසේකර මහතා සඳහන් කළේය.

පාර්ලිමේන්තු මහජන නියෝජිතයන් ආචාර ධර්ම පිළිනොපැදීම නිසා උත්තරීතර පාර්ලිමේන්තුව තුළ ගුටි ඇන ගන්නා බවද පවසා සිටියේය.

සාමාන්‍ය පුද්ගලයන් ඒ ආකාරයට හැසිරුණහොත් කෙළින්ම පොලිස් අත්අඩංගුවට ගෙන අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා බවද අධ්‍යක්ෂවරයා සඳහන් කළේය.

එහෙත් පාර්ලිමේන්තුව තුළ සිදු වූ සිද්ධීන් සම්බන්ධයෙන් එවැනි දඬුවමක් ලබානොදුන් බවද ඔහු පවසා සිටියේය.

ඊයේ (11දා) පැවැති මාධ්‍ය සාකච්ඡාවකදී මේ බව කී අධ්‍යක්ෂවරයා වැඩිදුරටත් සඳහන් කළේ සාමාන්‍ය ජනතාවට එක නීතියකුත්, මන්ත්‍රීවරුන්ට වෙනත් නීතියකුත් ක්‍රියාත්මක විය නොහැකි බවයි.

වර්තමාන ආණ්ඩුව රට තුළ යහපාලනය ඇති කරන බවට පොරොන්දු ලබා දී තිබෙන බවත්, එම පොරොන්දු ඉටු කිරීම ආණ්ඩුවේ වගකීමක් බවත් අසෝක ඔබේසේකර මහතා සඳහන් කළේය.

යහපාලනය වෙනුවෙන් ලබාදුන් පොරොන්දු ඉටු නොකළහොත් ජනතාව දේශපාලඥයන් විශ්වාස නොකරනු ඇති බවද හෙතෙම පවසා සිටියේය.

March 12 Movement